





27 වන පිටෙන්



**ඔබ මේ දිනවල නිරත වී සිටින සාහිත්‍ය කටයුතු මොනවාද?**

**චාරු:**
විශේෂිත දෙයක් නැහැ. හැමදාම කළා වගේ පුංචි පුංචි කවි ලියනවා,සිංහලෙන් කතන්දරයකුත් ගොඩනගාගෙන යනවා. 2011 ‌හේ ග්‍රේෂන් සම්මානයට නිර්දේශ වුණ Autumn Leaves පිටපත නැවත කියවනවා. මොකද ජීවත්ව සිටියොත් , ලබන වසරේ එය එළි දක්වන්නට පොඩි බලාපොරොත්තුවක් තිබෙන නිසා.

**මවකගේ භූමිකාව තුල සක්‍රියව කැපවීමෙන් ජීවත්වන ඔබ තම ලේඛනයට අවශ්‍ය ප්‍රස්තූතයන් සොයා යන ගමන තුල අත්දකින ප්‍රායෝගික අර්බුද මොනවාද?**

**චාරු:**
මවකගේ භූමිකාව තුල සක්‍රියව කැපවීමම කතන්දර ගොඩකට මුල පිරීමක්.පුංචි හිත් එක්ක ජීවත්වෙන එකම ඇති පොත් ගණනක් පිරෙන්න ලියන්න. ඒ නිසා ප්‍රස්තූතයන් සොයා යාමක් අවශ්‍ය වෙන්නේ නැහැ.ඇත්තටම ජීවිතේ අපි පණ පොවන සෑම භූමිකාවක්ම නිරන්තරයෙන්ම ලේඛණයට ප්‍රස්තූත සපයනවා.රචනයට කාල වේලාව සොයා ගැනීමේදී නම් ගැටළු මතුවෙන්න පුළුවන්.නමුත් ඔබ ආසා කරන දේවල නිරත වීමට ඔබ කොහොම හරි කාලය සොයා ගන්නවා. මොකද එයින් තොරව ඔබට ජීවත් විය නොහැකි නිසා. පාසලේ ගුරු කාමරයේ, ගෙදරදී දරුවන් පොත්පත් වල වැඩ කරන වෙලාවට, වාහනයේ එහාට මෙහාට යන අතරතුර, මහරෑට හැමෝම නිදාගත්තට පස්සෙ, මේ වගේ ඉඩ ලැබෙන හැම විටම මම ලිව්වා. දැන් නම් විශාල නිදහසක් තියෙනවා, මොකද දැන් මම රැකියාවක් නොකරන නිසා, සහ දූ දරුවන් වැඩී ඇති නිසා. ඔවුන් පාසල් ගියාට පස්සේ,උදේ හතේ ඉඳලා හවස තුන වෙන තුරු කාලය තනිකරම මගේ.

**නිර්මාණයක ආකෘතිය ගැන ඔබ දරන මතය කුමක්ද?**

**චාරු:**
ආකෘතිය එතරම් දෘඪ නොවිය යුතුයි කියලා මම හිතනවා. ආකෘතිය රැකීමට කතා රසය හෝ සන්ධර්භය කිසිසේත්ම කැප කළ යුතුනොවේ. ආකෘතිය කල යුත්තේ කතාව ඉදිරිපත් කිරීමට සැකිල්ලක් සැපයීම පමණයි. එක් එක් කතාවට ගැලපෙන ආකෘතියක්, කථාව පාඨකයාට ගෝචර වන පරිදි ඉදිරිපත් කරන්නට උත්සාහ දරද්දී නිකම්ම සැකසෙනවා.

**ආකෘතිය හා ප්‍රස්තූතය අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගීමේදී ඔබ භාවිතා කරන ක්‍රමවේදය කවරක්ද?**

**චාරු:**
විශේෂිත ක්‍රමවේදයක් ඔස්සේ ක්‍රමානුකූලව රචනයක් කිරීමක් මගෙන් සිදුවන්නේ නැහැ. මම සාහිත්‍යය හෝ , ඉංගිරිසි- සිංහල භාෂා හෝ, නවකථා/ රචනා කලාව හෝ විධිමත්ව හදාරපු කෙනෙක් නෙමෙයි. කතාවක් හිතේ පතුලට වෙලා, ලියන්නට බල කරන විට මම ලියනවා. ප්‍රස්තූතය නිරායාසයෙන්ම මනසේ වර්ධනය වෙද්දි, එයට වඩාත්ම ගෝචර ආකෘතිය සැකසිලා,ඒ ඔස්සේ මම ලියනවා. හැමෝම මෙහෙම ලියන්නෙ නැතුව ඇති. බොහෝ උගත් ලේඛකයන්ට රචනා කලාව තමාට සිතැඟි හසුරුවන්නට පුළුවන්.මට එහෙම අපහසුයි. නිරායාසයෙන්ම ලියවෙද්දී පමණයි මම ලියන්නේ.